# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 31 .07.2017

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2017

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

**2017 මැයි මස ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් තත්ත්වය මත විපතට පත් රාජ්‍ය ව්‍යවසායයන්හි නිලධරයන්ට විශේෂ ණය අත්තිකාරම් මුදලක් ලබා දීම**

2017 ජුනි 28 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ අංක 14/2017 මඟින් දන්වා ඇති පරිදි ගං වතුර හා නායයාම් තත්ත්වය මත විපතට පත් රාජ්‍ය නිලධාරින්ට පොළී රහිත ණය පහසුකමක් ලබා දීමට තීරණය කර ඇති අතර ඒ අනුව යමින් 2017 මැයි මාසය තුළ දිවයිනේ විවිධ ප්‍රදේශවල අධික වර්ෂාව නිසා ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් හේතු කොට ගෙන විපතට පත් වූ රාජ්‍ය ව්‍යවසායයන්හි නිලධරයන්ට පොළී රහිත විශේෂ ණය අත්තිකාරම් මුදලක් ලබා දීමට තීරණය කරනු ලැබ ඇත.

02. මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ස්ථිර නිලධරයන් සඳහා සිය මාසික මූලික වැටුප මෙන් හය ගුණයක ප්‍රමාණයට සමාන මුදලක් සමාන මාසික වාරික තිස් හයකින් (36) ද , තාවකාලික හෝ අනියම් නිලධරයන් සඳහා සිය මාසික මූලික වැටුප මෙන් තුන් ගුණයක ප්‍රමාණයට සමාන මුදලක් සමාන මාසික වාරික දහ අටකින් (18) ණය ලබා දුන් මාසයට ආසන්නතම ලිත් මාසයේ සිට ආපසු අයකර ගැනීමට යටත්ව ලබා දිය හැකි ය.

03. මෙම ණය මුදල වැටුපෙන් අඩු කළ හැකි මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාවෙන් නිදහස් වේ.

04. අදාළ නිලධාරියා විසින් මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ලබා ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක 01 ප්‍රකාරව තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගේ නිර්දේශය සහිතව ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ඉල්ලීම අංශ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

05. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද නිලධරයන්ගේ ඉල්ලීම් පරීක්ෂා කර එහි නිරවද්‍යතාවය පිළිබඳව පෞද්ගලිකව සෑහීමකට පත් විය හැකි නම් පමණක් ඉල්ලුම්කරුගේ අංශ ප්‍රධානියා මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල නිර්දේශ කර අනුමැතිය සඳහා ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි/අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

06. මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල 2017 වර්ෂයේ මැයි මාසයේ දිවයිනේ විවිධ ප්‍රදේශ වල අධික වර්ෂාව නිසා ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් නිසා ආපදාවට ලක් වූ නිලධරයන් සඳහා පමණක් සීමා කර ලබා දිය යුතු ය.

07. සේවයේ ස්ථිර නිලධරයන් මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ලබා ගැනීම සඳහා ඇපකරුවන් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එසේ වුව ද තාවකාලික හෝ අනියම් පදනම මත සේවයේ යෙදී සිටින නිලධරයන් මෙම ණය අත්තිකාරම් මුදල ලබා ගැනීමට නම් මේ සමඟ අමුණා ඇති ආකෘතිපත්‍ර අංක 02 ප්‍රකාරව සේවයේ ස්ථිර කර ඇති නිලධරයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

08. 2017.08.31 දිනෙන් පසු මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නොකළ යුතු ය.

ආර්.එච්.එස් සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. විගණකාධිපති
03. ලේකම්, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

ආකෘති පත්‍ර 01

**2017 මැයි මාසය තුළ අධික වර්ෂාව නිසා ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් හේතුවෙන් විපතට පත්වූ රාජ්‍ය නිලධරයන් සඳහා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ..../2017 අනුව විශේෂ ණය අත්තිකාරම් මුදලක් ඉල්ලුම් කිරීම**

01. නිලධරයාගේ සම්පූර්ණ නම ..................................................................................................

02. තනතුර...................................................................................................................................

03. ආයතනයේ නම..........................................................................................................................

04. පත්වීමේ ස්වභාවය ස්ථිර ☐ තාවකාලික ☐ අනියම් ☐

05. I. සේවයට පත් වූ දිනය.....................................................................................................

II. සේවයේ ස්ථිර කළ දිනය..................................................................................................

06. සේවා ස්ථානයේ ලිපිනය

.............................................................................................................................................

.............................................................................................................................................

07. පදිංචි ලිපිනය

ස්ථිර:....................................................................................................................................

.............................................................................................................................................

තාවකාලික:...........................................................................................................................

.............................................................................................................................................

08. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ....................................................................................

09. ආපදාවේ ස්වභාවය සහ හානි වූ දේපළ පිළිබඳ විස්තර:

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

10. නිලධරයා සමඟ ආපදාවට ලක් වූ පවුලේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු

| නම | නිලධරයාට ඇති සම්බන්ධතාවය |
|---|---|
| | |
| | |
| | |

11. ආපදාවට පෙර අවසන් වරට සේවයට වාර්තා කළ දිනය..................................................

12. ආපදාවෙන් පසු සේවයට වාර්තා කළ දිනය ..................................................

දිනය ..........................................  නිලධරයාගේ අත්සන ..........................................

**13. ග්‍රාම නිලධාරිගේ නිර්දේශය**

ඉහත නම් සඳහන් ..........................................මයා/මිය/මෙනෙවිය මාගේ ග්‍රාම සේවා වසමේ සථිර පදිංචිකරුවෙකු වන අතර ඔහු /ඇය විසින් ආපදා තත්ත්වයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැවින් විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නිර්දේශ කරමි.

නම ......................................

දිනය..........................................  අත්සන..............................................

(නිල මුද්‍රාව යොදන්න)

**14. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය**

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/එකඟ නොවෙමි. විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

දිනය ..........................................  අත්සන..............................................

(නිල මුද්‍රාව යොදන්න)

**15. අංශ ප්‍රධානියාගේ නිර්දේශය**

නිලධාරියාගේ මාසික මූලික වැටුප ..........................................................................

ගෙවිය හැකි විශේෂ ණය අත්තිකාරම් මුදල ..................................................................

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/එකඟ නොවෙමි. විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

දිනය ..........................................  අත්සන ..........................................

(නිල මුද්‍රාව යොදන්න)

**16. ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි/අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය**

..........................................මයා/මිය/මෙනෙවිය හට රු. ..................................ක විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීමට අනුමත කරමි/ නොකරමි.

නම.......................................................................

තනතුර...................................................................

දිනය..............................................  අත්සන...................................

(නිල මුද්‍රාව යොදන්න)

ආකෘති පත්‍ර 02

<u>ඇපකරුගේ ප්‍රකාශය ( ස්ථිර නිලධරයන් සඳහා මෙම කොටස අදාළ නොවේ)</u>

මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ණයකරු විසින් මොනයම් අවස්ථාවක දී හෝ ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එසේ ගෙවීම පැහැර හරිනු ලබන දිනට පවතින ණය මුදලේ ශේෂය ණයලාභියා වාරික ගෙවීමට එකඟ වී ඇති පරිදි මාගේ වැටුපෙන් අයකර ගැනීමට එකඟ වෙමි.

| | |
|---|---|
| 01. ඇපකරුගේ නම | :........................................................................ |
| 02. දැනට දරන තනතුර | :........................................................................ |
| 03. දැනට සේවය කරන අංශය | :........................................................................ |
| 04. සේවයට පත් වූ දිනය | :........................................................................ |
| 05. සේවයේ ස්ථිර කරන ලද දිනය | :........................................................................ |
| 06. ආයතනයේ අඛණ්ඩ සේවා කාලය | :........................................................................ |
| 07. ඇපවන මුදල | :........................................................................ |
| 08. අත්සන | :........................................................................ |
| 09. දිනය | :........................................................................ |

ඉහත ඇපකරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය :.........................................

..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව